## Covid – 19 සති පාසල (සබරගමුව)

කාර්යය පත්‍රිකාව

නර්තනය - 9 ශ්‍රේණිය

11- වාරය

මැයි මාසය සිව්වන සතිය, (මැයි 25 සිට මැයි 29 දක්වා කාලය)

---

නිපුණතා මට්ටම : නියමිත තිත් රූප හා නාද මාලා අනුගමනය කරමින් ගායනය ඉදිරිපත් කරයි.

ක්‍රියාකාරකම : ගොයම් කැපීමේ කවි ගායනා කරමු.

මෙම පාඩමට අදාලව පහත ක්‍රියාකාරකම් ඔබ විසින් සිදුකල යුතුව ඇත.

පළමු පියවර : ඔබ 9 ශ්‍රේණියේ පළමු වාරයේ ගායනා කරනලද ගායනා නැවත වරක් ගායනා කරන්න.

දෙවන පියවර : එම ගායනා සේම ගොයම් කැපීමේ කවිත් අපි ගායනා කල යුතුයි, ඊට පෙර මේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය හැකිදැයි බලන්න.

1 - ගොයම් කැපීමේ ගායනා සිදුකරන්නේ කුමන කාර්යයේදීද ?
2 - එහිදී මෙම කවි ගායනා කරන්නේ කුමන හේතුවක් නිසා ද?
3 - ගොයම් කැපීමේ කවි වලින් පිළිබිඹුවන්නේ කුමන කරුණු පිළිබඳවද ?
4 - ගොයම් කැපීමේ කවි නිර්මාණය කරන ලද්දේ කව්රුන් විසින්ද ?
5 - ගොයම් කැපීමේ කවි වල දක්නට ඇති දේව විශ්වාස මොනවාද ?

තුන්වන පියවර : දැන් පහත කවි ඔබට ගායනා කිරිමට හැකිදැයි උත්සාය කරන්න.

හතරවන පියවර : ගායනා කිරීමට නොහැකිනම් සිත් තැවුල් ඇතිකර නොගන්න ඔබට පාසැල් ගිය පසු කියාදේවි ඒ නිසා මෙම කවි පාඩම් කරගන්න.

ගොයම් කැපීමේ ගායනාව

ගොයම් කැපීමේ ගායනාවල සමාජීය හා සංස්කෘතික පසුබිම කෘෂිකාර්මික ජන සමාජය තුළ ජීවත් වූ මිනිසා තම වෘත්තිය ලෙස වී ගොවිතැන යොදාගෙන ඇත. මෙම කාර්යයෙහි යෙදෙන ගොවියා තම ශරීරයට දැනෙන වෙහෙස, මහන්සිය, විඩාව ,පාළුව මගහරවා ගැනීම පිණිස ගොයම් කැපීමේ කවි ගායනා කරයි. මෙය ගැමි ජනතාවගේ සහජීවනය ඉස්මතු කරන සාමූහකි ක්‍රියාවලියකි. ගැමි සමාජයේ දක්නට ලැබෙන සමාජ සාරධර්ම මෙන් ම ඔවුන් තුළ පවතින විශ්වාස පහත කවිවලින් ගම්‍ය වේ. සරල තාලරූප හා නාදමාලා අනුව ගැමි බස් වහර පිළබිඹුවන පරිදි මෙම කවි නිර්මාණය වී ඇත.

රන් දැකැති ගෙන නිති සැරසෙනවා - රත්රන් පටි ඉණවට දිලිසෙනවා
රිවි දුටු පිනි බිඳු ලෙස පහවෙනවා - දුම්බර කෙතෙ අපි ගොයම් කපනවා

ඉරු දෙවියන්ගේ ඉරගල ගාවා - සඳ දෙවියන්ගේ සඳගල ගාවා
ගණ දෙවියන්ගේ කෝවිල ගාවා - අපිත් කියමු කවි ගොවිපළ ගාවා

උදේ සිටන් වකුටු කොන්ද දිග හැරපල්ලා - අතේ තියෙන ගොයම් මිටිය බිම දමපල්ලා
හිසේ තියෙන ලේන්සු පොඩි අතට ගනිල්ලා - සතර වරම් දෙවි පිහිටෙන් ගොඩ පලයල්ලා

එපා කියන තැන තැන නොසිටිල්ලා - පිපාස නම් දියවර බීපල්ලා
අපාසු නම් සෙවණේ සිටපල්ලා - කපා ගොයම් කඩිනම් කරපල්ලා

සැකසීම - නිවිතිගල කලාප අධ්‍යාපන කාර්යාලීය
සෞන්දර්ය අංශය වෙනුවෙන්,
එම්. ජේ. රංගන එම්. මුණසිංහ මයා,
රඹුක මහා විද්‍යාලය,
පොතුපිටිය, කලවාන.
voice - 0719227246